# රජයේ නිවේදනයයි

## 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධාන ක්‍රියාවට නැංවීම සම්බන්ධව නිවාස සහ සමෘද්ධි අමාත්‍යාංශයෙහි ලේකම් විසින් පලකරනු ලබන රජයේ නිවේදනයයි.

1. **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

උක්ත පනතෙහි 1 වන වගන්තිය මගින් ඉදිකිරීම් විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ශ්‍රී ලංකා ජනරජයේ අංක 1896/19 හා 2015 ජනවාරි 06 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පළ කරන ලද නියමයක් මගින් නියම කරන ලද පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත 2014 දෙසැම්බර් 29 දින පටන් (නියමිත දිනය යනුවෙන් සඳහන් කරනු ලබන) ක්‍රියාත්මක විය. ඒ අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර එකී නියමිත දිනයෙහිදී පටන් ක්‍රියාත්මක වේ.

2. **ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (ඉක්ටාඩ් ) සංස්ථාගත කරනු ලැබූ අති විශේෂ ගැසට් නිවේදනය ඉවත් කිරීම**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 65(1) උප වගන්තිය ප්‍රකාරව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද ඉක්ටාඩ් ආයතනය සංස්ථාගත කරනු ලැබූ එකී ශ්‍රී ලංකා ජනරජයේ අංක 718/15 හා 1992 ජූනි 10 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය එකී නියමිත දිනයෙහි පටන් ඉවත් කළ ලෙස සලකනු ලැබේ.

ඒ අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය එකී නියමිත දිනයෙහි පටන් ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ඉක්ටාඩ් ආයතනයේ ) නෛතික අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබේ.

3. **ඉක්ටාඩ්හි වත්කම් සහ වගකීම් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වත්කම් සහ වගකීම් බවට පත්වීම.**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීමත් සමඟ ඉහත සඳහන් නියමය ඉවත් වීම නොතකා ඉහත කී නියමිත දිනයෙහි පටන් ඉක්ටාඩ්හි පහත සඳහන් වත්කම් සහ වගකීම් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වත්කම් සහ වගකීම් බවට පත්වේ.

අ) ඉක්ටාඩ්හි සියලු චංචල සහ නිශ්චල දේපල

ආ) ඉක්ටාඩ් විසින් හෝ එය සමඟ ඇතිකරගත් සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්

ඇ) ඉක්ටාඩ් විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද සියලු නඩු, ක්‍රියා සහ වෙනත් නීති කෘත්‍ය

ඈ) ඉක්ටාඩ් සතු සියලු අයිතිවාසිකම්, වගකීම් සහ බැදීම්

ඉ) ඉක්ටාඩ්හි වාසියට හෝ එයට එරෙහිව ඇති සෑම තීන්දු ප්‍රකාශ, ආඥා හෝ නඩු තීන්දු

ඉක්ටාඩ්හි ප්‍රකාශන සහ ලේඛන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ප්‍රකාශන සහ ලේඛන ලෙස බලාත්මකව පැවතිය යුතු අතර ඒවා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රකාශන සහ ලේඛන බවට පත්වේ.

**පී.එච්.එල්. විමලසිරි පෙරේරා**
**ලේකම්**
**නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය**
2015-05-08